# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
### (බාහිර) - 2007

### පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC - E1015

### පුස්තකාලයාධිපතිත්වය, තොරතුරු සාක්ෂරතාව හා තොරතුරු කුසලතා

<u>ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි | කාලය : පැය 03 යි

---

01. අ) පුස්තකාල හා විඥාපන වෘත්තිය අනෙකුත් සියලු ම වෘත්තීන්ට පාදක වෘත්තියක් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) පුස්තකාල හා විඥාපන වෘත්තියේ මූලික ආචාර ධර්ම කවරේද? (ලකුණු 10)

02. අ) සාමාන්‍ය සාක්ෂරතාව හා තොරතුරු සාක්ෂරතාව අතර ඇති වෙනස පහදන්න. (ලකුණු 10)

ආ) වර්තමාන සමාජ සන්දර්භයේ දී තොරතුරු සාක්ෂරතාව වැදගත් සාධකයක් සේ සලකනු ලබන්නේ මන්දැයි සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 10)

03. අ) සමාජ සංවර්ධන ක්‍රියාවලියෙහි ලා ග්‍රන්ථ විඥාපන පාලනයේ දායකත්වය ප්‍රමාණ කරන්න. (ලකුණු 10)

ආ) ග්‍රන්ථ විඥාපන පාලන උපකරණ ලෙස පුස්තකාල සූචි හා ග්‍රන්ථ නාමාවලීවල වැදගත්කම පහදන්න. (ලකුණු 10)

04. ''තොරතුරු සැපයීමේ ක්‍රියාවලියේ දී ඉලෙක්ට්‍රොනික මූලාශ්‍ර (electronic resource) විසින් සපයනු ලබනුයේ අතිශය කාර්යක්ෂම සේවාවකි.'' පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

05. පහත සඳහන් මාතෘකා අතුරින් <u>**සතරක්**</u> යටතේ කෙටි සටහන් ලියන්න.

1. විශ්ව ව්‍යාප්ත ජාලය (WWW)
2. බ්‍රවුසර (Browsers)
3. ගවේෂණ යන්ත්‍ර (Search engines)
4. ග්‍රන්ථ නාමාවලී (bibliographies)
5. සාර සංග්‍රහ (abstracts)

06. 1. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු උද්ධරණය කොට දැක්වීම යනු කුමක් ද?
(ලකුණු 03)

11. එහි අවශ්‍යතාව කුමක් ද? (ලකුණු 05)

111. හාවර්ඩ් උද්ධරණ ක්‍රමය යටතේ
- අ) ඒක කර්තෘක සඟරා ලිපියක්
- ආ) ත්‍රෛකර්තෘක ග්‍රන්ථයක්
- ඇ) අඥාත කර්තෘක කෘතියක්

සංක්ෂිප්තව හා පූර්ණ වශයෙන් උද්ධරණය කොට දක්වන අයුරු නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

07. 1. කියැවීම යනු කුමක් ද? (ලකුණු 05)

11. පාඨකයකු සතු විය යුතු කියැවීමේ කුසලතා කවරේදැයි පහදන්න.
(ලකුණු 15)

***************************